## මහජන බැංකු ණය කාඩ්පත් සඳහා අදාළ වන කොන්දේසි සහ නියමයන්

මහජන බැංකු ණය කාඩ්පත [People's Credit Card] පරිහරණය කිරීම මගින් ඔබ පහත සඳහන් වන කොන්දේසි සහ නියමයන්ට එකඟ වූ ලෙස සැලකේ.

මහජන බැංකුව විසින්, එම බැංකුවේ ලාංඡනය සඳහන් කරමින් නිකුත් කෙරෙන කවර හෝ ණය කාඩ්පතක් [Credit Card] සඳහා පහත සඳහන් කොන්දේසි සහ නියමයන්ට අදාළ වේ.

1. **කාඩ්පත**
   - 1.1. කාඩ්පත මහජන බැංකුවට අයත් දේපළක් වන අතර, බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන ඕනෑම අවස්ථාවක දී කාඩ්පත් හිමියා හෝ හිමිකාරිය හෝ විසින් ආපසු භාර දෙනු ලැබිය යුතුය.
   - 1.2. කාඩ්පත හිමිකරුවා/හිමිකාරිය ගෙන්, කාඩ්පත, එය පරිහරණය කිරීමට හිමිකරුවාට/හිමිකාරියට ඇති අයිතිය සහ එය භාවිත කරමින් ගණුදෙණුවක යෙදීමට ඇති බලය සීමා කිරීම හෝ අහිමි කිරීම සාධාරණ යැයි හැඟෙන ඕනෑම විටක පූර්ව දැනුම් දීමකින් හෝ හේතු දැක්වීමකින් තොරව බැංකුව විසින් එසේ සිදු කරනු ලැබේ.

2. **කාඩ්පත පරිහරණය කිරීම**
   - 2.1 කාඩ්පත ලබා ගන්නා ලද පුද්ගලයා (හිමිකරුවා/හිමිකාරිය) විසින් එසේ ලබා ගන්නා ලද කාඩ්පතේ පසුපස වහාම ස්වකීය අත්සන සලකුණු කල යුතු වන අතර, අන් සතු නොකිරීමට ද වග බලා ගත යුතුය. ඔහු/ඇය විසින් කාඩ්පත ආරක්ෂාකාරීව පරිහරණය කරනු ලැබීම අනිවාර්ය වේ. එසේම, එය සෑම විට ම පරිහරණය කරන්නාගේ පෞද්ගලික සුරක්ෂිතතාව යටතේ පවත්වා ගැනීමේ වගකීම කාඩ්පත් හිමිකරුවා/හිමිකාරිය සතු වගකීමකි.
   - 2.2 සියළුම කාඩ්පත් ආසන්න මහජන බැංකු ශාඛාවට හෝ හිමිකරුවා/හිමිකාරිය විසින් අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති අදාළ ශාඛාවට හෝ කාඩ් මධ්‍යස්ථානයට හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි ඔබගේ පෞද්ගලික ලිපිනයට හෝ යොමු කරනු ලැබේ. එලෙස කාඩ්පත හිමිකරුවා/හිමිකාරිය විසින් හෝ අතිරේක කාඩ්පත් හිමිකරුවා/හිමිකාරිය විසින් හෝ ස්වකීය අනන්‍යතාව තහවුරු කර කාඩ්පත/කාඩ්පත් භාර ගැනීම සිදු කළ යුතුය. කාඩ්පත හිමිකරුවා/හිමිකාරිය විසින් කාඩ්පත පිළිගැනීම හෝ භාර ගැනීම සඳහා ලිඛිතව බලය පවරනු ලබන අයකුට එසේ සිදුකරනු ලැබිය හැකි වන අතර, එහි අවදානම ඔවුන් විසින් දැරිය යුතුය. එසේම කාඩ්පත හිමිකරුවා/හිමිකාරිය හෝ බලය පවරනු ලබන්නා හෝ විසින් එය භාර ගන්නා ලද අවස්ථාවේ සිට කාඩ්පත මගින් සිදුකරනු ලබන සියළුම වියදම්වල වගකීමට බැඳෙනු ඇත. බැංකුව විසින් සිය අභිමතය පරිදි තුන්වැනි පාර්ශවය යැයි තීරණය කෙරෙන හෝ අයකුට කාඩ්පත භාර දෙනු ලැබුවහොත් එසේ භාර දෙන ලද අවස්ථාවේ සිට කාඩ්පත මගින් සිදුකරනු ලබන සියළුම වියදම්වල වගකීමට හිමිකරුවා/හිමිකාරිය බැඳෙනු ඇත.
   - 2.3 කාඩ්පත භාවිත කිරීමට පෙර කාඩ් මධ්‍යස්ථානය දුරකථන මගින් අමතා ඔබගේ අනන්‍යතාවය තහවුරු කර, කාඩ්පත සක්‍රිය කර ගැනීමට කටයුතු කළ යුතුය.
   - 2.4 පුද්ගලික රහස්‍ය අංකය [PIN] ගණුදෙණුකරු/ගණුදෙණුකාරිය වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවීමට කටයුතු කරනු ලබයි. එසේ නිකුත් කිරීමෙන් පසු තැපැල් දෙපාර්තමේන්තුව හරහා නැවත එය ආපසු නොලැබුන විටක, ගණුදෙණුකරු/ගණුදෙණුකාරිය විසින් පුද්ගලික රහස්‍ය අංකය [PIN] ලබාගත් පසු එය අන්සතු කල නොහැකි වන්නා වූ අදාළ ගණුදෙණුකරුගේ/ගණුදෙණුකාරියගේ දේපළක් වන අතර, එහි සුරක්ෂිත භාවය පිළිබඳ වගකීමට සියළු ආකාරයෙන් ම ඔහු/ඇය බැඳේ.
   - 2.5 කාඩ්පත් හිමිකරු/හිමිකාරිය, කාඩ්පත් සහ පුද්ගලික රහස්‍ය අංකය [PIN], හෝ කාඩ්පත සහ අත්සන හෝ කාඩ්පතේ අන්තර්ගත දත්තයන් වන කාඩ්පතේ අංකය, කල් ඉකුත් වන දිනය සහ කාඩ්පත හිමිකරු/හිමිකාරිය තහවුරු කර ගැනීමේ අගය (කාඩ්පතේ පසුපස ඇති අත්සන

සලකුණු කෙරෙන කොටසේ මුද්‍රිතව ඇති) හෝ භාවිතා කරමින් සිදුකෙරෙන සියළුම ගෙවීම් වලට නෛතිකව බැඳේ. එසේ ම, කාඩ්පත හිමිකරු/හිමිකාරිය වංචා සහගත ලෙස, වගකීම් විරහිත ලෙස, කාඩ්පත සහ/හෝ එහි පුද්ගලික රහස්‍ය අංකය [PIN] සහ/හෝ කාඩ්පතට සම්බන්ධ වෙනත් දත්ත සහ අස්ථානගත වීම්, සොරකම් කිරීම පිළිබඳව නිසි පරිදි බැංකුව දැනුවත් නොකර කටයුතු කර ඇත්නම් හෝ කාඩ්පතට අදාළ සියළුම ගෙවීම් වලට නෛතිකව බැඳේ. එසේ කාඩ්පත පුද්ගලික රහස්‍ය අංකය [PIN] හෝ බැංකව විසින් කවරහෝ සන්නිවේදන මාර්ගයකින් කලින් කලට නිර්දේශ කෙරෙන කාඩ්පතට සම්බන්ධ වෙනත් දත්ත ආරක්‍ෂා කිරීමට කවරාකාරයකින් හෝ අසමත් වීම ඉහත සඳහන් වංචා සහගත භාවයට බලපාන මූලික නොසැලකිලි තත්වයන් ලෙස පිළිගැනේ.

2.6 ණය කාඩ්පත මගින් කළහැකි ගණුදෙණු, පෞද්ගලික ස්වභාවයේ ගණුදෙණු පමණක් වන අතර වාණිජ ස්වභාවයේ ගණුදෙණු සඳහා භාවිතා කිරීම නොකළ යුතු බවට ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් පනවා ඇති සීමාවන් අනුව ක්‍රියා කිරීමට කාඩ්පත් හිමිකරු/හිමිකාරිය වගබලා ගත යුතුය. බැංකුව විසින් කාඩ්පත සඳහා ගිණුමක් (ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම) පවත්වාගෙන යනු ලබන අතර, එයට කාඩ්පත පරිහරණය කරමින් මිල දී ගැනෙන භාණ්ඩ හා සේවාවන්, කාඩ්පත භාවිත කිරීමෙන් සිදු වන්නා වූ සියලු මූල්‍ය ගණුදෙණු පිළිබඳ විස්තර (කාඩ්පතේ ගණුදෙණු) සහ වෙනත් සියළු වැය තොරතුරු අන්තර්ගත කරනු ලැබේ. කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් බැංකුවේ වගකීම හා බැඳෙන හෝ එසේ නොවන විකුණුම් හෝ ගණුදෙණු වවුචරයන්ට අදාල අත්සන් සලකුණු නොකිරීම, බැංකුව හා බැඳුණු වගකීමකට කවරාකාරයකින් හෝ බලපෑමක් නොකරයි. නිකුත් කළ බැංකුව, හිමිකාර බැංකුව හෝ අළෙවිකරුවා, කාඩ්පතේ සඳහන් වන අත්සන සහ අලෙවිලදුපතක් සඳහන් වන අත්සන අතර නොගැලපීමක් වැනි මතභේදයක දී කවරාකාරයකින් හෝ වගකීමකට බැඳීමක් නොමැත.

2.7 කාඩ්පත නීත්‍යානුකූල නොවන සහ විදේශීය වෙළඳාමට සම්බන්ධ ව්‍යාපාරික ගණුදෙණු සඳහා භාවිත කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

2.8 කලත්‍රයා සිය දරුවන් සහ දෙමව්පියන්ගේ ප්‍රයෝජනය සඳහා හැර වෙනත් තුන්වන පාර්ශවයක් සඳහා කාඩ්පත භාවිත නොකළ යුතුය.

2.9 කාඩ්පත හිමිකරු/හිමිකාරිය හෝ තුන්වැනි පාර්ශවය විසින් සිදු කරන ලදැයි, විශ්වාස කළ හැකි ආරවුල් සහගත ගණුදෙණුවකට සම්බන්ධ මූල්‍යමය වටිනාකම, කාඩ්පත හිමිකරුගෙන්/හිමිකාරියගෙන් අයකර ගැනීමේ බලය බැංකුව සතු වේ.

2.10 කාඩ්පත් ගිවිසුම අවසන් වන තෙක්, බැංකුව විසින් නිකුත් කරන ලද කාඩ්පත් (අතිරේක කාඩ්පත ද ඇතුළුව) සම්බන්ධව සියළුම ගාස්තු ගෙවීම සඳහා කාඩ්පත හිමිකරු/හිමිකාරිය බැඳී සිටී.

## 3. ණය සීමාව

3.1 ගණුදෙණුකරු වෙත ලබාදෙන කාඩ්පත් ණය සීමාව තීරණය කිරීමේ අයිතිය බැංකුව සතුවේ.

3.2 බැංකුව විසින් කාඩ්පත් ගිණුමට අදාළව කාඩ්පත් හිමියා වෙත අනුමත කර ඇති ණය සීමාවට දැඩිව අනුගත විය යුතුය. එය නිකුත් කිරීමෙන් සැලකිය යුතු කාලයක් ගත වීමෙන් පසු කාඩ්පත හිමිකරුට/හිමිකාරියට, ණය සීමාව නැවත සංශෝධනය සඳහා අයදුම් කළ හැකිය. ණය සීමාව වැඩි කිරීම බැංකුවේ බලපැවැත්වෙන කොන්දේසි අනුව සිදුකෙරෙනු ඇත.

3.3 බැංකුවට සාධාරණ හේතු ඇති ඕනෑම අවස්ථාවකදී ණය සීමාව අඩු කිරීමට බැංකුවට අයිතිය ඇත.

3.4 ණය සීමා ඉක්මවා ඇතිදැයි විමසීම සඳහා ගණනය කිරීමේදී, ඒ වන තෙක් ගිණුමට බැර කර නොමැති ගණුදෙණු පිළිබඳ විස්තර සැලකිල්ලට ගනු ලැබේ.

3.5 කාඩ්පත් මධ්‍යස්ථානය, කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් අයදුම්පතේ සඳහන් කෙරෙන තොරතුරු පිළිබඳව නිරවද්‍යතාව තහවුරු කර ගනී. එවැනි අවස්ථාවකදී අදාළ තොරතුරු අසත්‍ය යැයි හැඟෙ නම්, කාඩ්පත අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව විසින් රඳවා තබා ගනු ලැබේ.

3.6 කාඩ්පත් ගිණුමේ සඳහන් වන සීමා ඉක්මයෑමක් හෝ සැක කටයුතු ගණුදෙණු සිදු වන බව තහවුරු වේ නම්, කාඩ්පත් ගිණුමේ ගණුදෙණු සීමා කිරීම හෝ අවලංගු කිරීමේ බලය බැංකුව සතුවේ.

## 4. අතිරේක කාඩ්පත්

4.1. බැංකුවේ අභිමතය පරිදි කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ සහ අතිරේක කාඩ්පත් හිමිකරුවන්ගේ පොදු ඉල්ලීම් යටතේ සහ එකඟතාවය මත පවුලේ ආසන්න සාමාජිකයන් සඳහා කාඩ්පතක්/කාඩ්පත් නිකුත් කළ හැකිය. 'පවුලේ ආසන්න සාමාජිකයන්' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් හිමිකරුගේ/හිමිකාරියගේ කළත්‍රයා කාඩ්පත් හිමිකරුගේ/හිමිකාරියගේ දරුවන් හෝ ඔහුගේ/ඇයගේ දෙමව්පියන් හෝ වෙති. කාඩ්පත් හිමිකරු/හිමිකාරිය සහ අතිරේක කාඩ්පත් හිමිකරුවන්/හිමිකාරියන් මෙම ගිවිසුමේ සඳහන් වන සියළුම කොන්දේසි සහ නියමයන්ට බැඳේ. තවද, මූලික කාඩ්පත් හිමිකරු/හිමිකාරිය සහ අතිරේක කාඩ්පත් හිමිකරු/හිමිකාරිය කාඩ්පත් ගිවිසුම මගින් තනි තනිව හා සාමූහිකව කාඩ්පත් වල ගෙවීම් සඳහා වගකිව යුතු වේ. තවද, හිමිකරු/හිමිකාරිය විසින් භුක්ති විඳින කාඩ්පත් වරප්‍රසාද සියල්ලම අතිරේක කාඩ්පත් හිමියාට ද හිමිවේ. එහෙත් අදාළ සීමාව තීරණය කිරීම මූලික කාඩ්පත් හිමියා සතු වගකීමකි. එසේ සඳහන් නොවන අවස්ථවක දී මූලික කාඩ්පත් හිමිකරුගේ ණය සීමාවම අතිරේක කාඩ්පත් හිමිකරුටද හිමිවේ.

4.2. ගිවිසුම අහෝසිවීම සහ කාඩ්පත පරිහරණය අවලංගුවීම සමග සියළුම අතිරේක කාඩ්පත් පරිහරණයෙන් ද අවලංගු වන අතර, ඒ අනුව වහාම අතිරේක කාඩ්පත් බැංකුව වෙත ආපසු භාර දීම සිදු කළ යුතුය.

4.3. වාර්ෂිකව අතිරේක කාඩ්පත් සඳහා ගාස්තුවක් ලෙස බැංකුව විසින් තීරණය කරනු ලබන අය කිරීමක්, කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

## 5. ගාස්තු සහ අයකිරීම්

5.1. අයවිය යුතු  අවස්ථාවන්හිදී කාඩ්පත් ගිණුමට හර කෙරෙන පදනම යටතේ කාඩ්පත සඳහා වන බැංකුවේ සම්බන්ධවීමේ ගාස්තු සහ වාර්ෂික ගාස්තු ගෙවීමට කාඩ්පත් හිමිකරු/හිමිකාරිය එකඟ වේ.

5.2. කාඩ්පත දූත සේවා මගින් විදේශයක පිහිටි ලිපිනයකට යැවෙන විටක, බැංකුව විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

5.3. කාඩ්පත් ණය සීමා ඉහළ නංවන අවස්ථාවන්හිදී, බැංකුව විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

5.4. අමතර කාඩ්පත් ප්‍රකාශන පිටපත් සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

5.5. අය විය යුතු අවම මුදල නියමිත දිනට ගෙවීමට නොහැකි වුවහොත් හෝ එයින් කොටසක් හෝ, නියමිත දිනයට පෙර/නියමිත දිනයේදී/නියමිත දිනයට පසුව ගෙවන ලද්දේ නම් හෝ මුළු ගණන නියමිත දිනයට පසු ගෙවන ලද්දේ නම් හෝ එ සඳහා පොලී අනුපාතයක් අය කෙරේ. අවසාන ප්‍රකාශනයේ සඳහන් දිනයේ සිට, ගෙවීම ලැබිය යුතු දිනය දක්වා සහ එතැන් සිට,ඊලඟ ප්‍රකාශනය නිකුත් කළ යුතු දිනය දක්වා සඳහන් වන මුළු අයවිය යුතු ශේෂය ගණනය කර, ගෙවනු ලබන කොටස/අවම මුදලට අදාළ පොලිය, ගණනය කරනු ලැබේ. අයවිය යුතු දිනයට

පසුව මුළු මුදල ගෙවීමක් කළ විට, පොළිය ගණනය කරනු ලබන්නේ ප්‍රකාශනය නිකුත් කළ දිනයේ සිට මුදල් ගෙවීමක් කළ දිනය දක්වා වූ මුදල් අයවිය යුතු ප්‍රමාණයට ය. ගෙවීමක් සිදු නොකර තිබෙන විටක, අවසාන ප්‍රකාශනයෙහි සඳහන් දිනය සහ ඊළඟ ප්‍රකාශනය නිකුත් කළ යුතු දිනය අතර කාලයේ දැක්වෙන මුළු අයවිය යුතු ශේෂයට අනුව, පොළිය ගණනය කරනු ලැබේ.

5.6. කාඩ්පත හිමිකරු/හිමිකාරිය, නියමිත දිනයට ගෙවිය යුතු අවම මුදල ගෙවීමට අසමත් වන්නේ නම්, බැංකුව විසින් තීරණය කරනු ලබන ප්‍රමාද ගාස්තුවක්, කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

5.7. ගණුදෙණුකරුවන්ගේ ඉල්ලීම පරිදි වෙනත් මූල්‍ය ආයතනයකට/තානාපති කාර්යාල වලට නිකුත් කරන හෝ එසේ ඉදිරිපත් කිරීමට තමා වෙත නිකුත් කරන ලිපි සඳහා අදාළ ගාස්තු කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

5.8. කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ නියෝගයට යටත්ව ඔහු/ඇය හෝ වෙනත් පාර්ශවයක් හෝ විසින් නිකුත් කරන ලද හෝ සිදු කරන ලද චෙක්පත් හෝ වෙනත් ගෙවීම් නියෝගයක් අගරු වී ඇති විටක බැංකුව විසින් තීරණය කරනු ලබන ගාස්තුව කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

5.9. සියළුම මූල්‍ය අත්තිකාරම් සඳහා, අත්තිකාරම් ගාස්තුවක් සහ මෙහෙයුම් ගාස්තුවක් ලෙස බැංකුව විසින් තීරණය කරනු ලබන අයකිරීමක් කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

5.10. කිසියම් බිල්පත් කාලච්ඡේදයක් සඳහා නියමිත ණය සීමාව ඉක්මවා ගිය විටකදී අනුමත සීමා ඉක්මවීම සඳහා වූ ගාස්තුවක් ලෙස, බැංකුව විසින් තීරණය කරනු ලබන අයකිරීමක් කාඩ්පත් ගිණුමට හර කරනු හර කරනු ලැබේ.

5.10.1. ඉහත කරුණට අනුව, නියමිත ණය සීමාව ඉක්මවා ගිය විටකදී සිදු කරනු ලබන ගණනය කිරීම් සඳහා බැංකු ගාස්තු වල අගයන් ද අදාළ කර ගනු ලැබේ.

5.11. ශ්‍රී ලංකාවේ පිහිටි ඉන්ධන පිරවුම්හල් වලින් ලබා ගැනෙන සියළුම පෙට්‍රල්, ඩීසල්, ගෑස් සහ වෙනත් සේවාවන් සහිත මිලදී ගැනීම් සඳහා මෙහෙයුම් ගාස්තුවක් ලෙස බැංකුවවිසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකට අනුව ගණනය කර අයකිරීමත්, කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

5.12. විකුණුම්/මුදල් අත්තිකාරම් සටහන් වන ඡායා පිටපත් වලට අදාළ පිටපත් කිරීමේ ගාස්තුවක් සහ බැංකුව විසින් තීරණය කරනු ලබන අයකිරීමක් කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

5.13. මහජන බැංකුවට අයිති නොවන ස්වකීය ටෙලර් යන්ත්‍ර මගින් සිදු කෙරෙන සියළුම ගණුදෙණු සඳහා මෙහෙයුම් ගාස්තුවක් අය කරනු ලැබේ.

5.14. නියමිත අලුත් කිරීම් හෝ අස්ථාන ගතවීම්/පළුදුවීම් නිසා හෝ කාඩ්පත් අලුත් කරනු ලබන සෑම විටම ගාස්තුවක් ලෙස බැංකුව විසින් තීරණය කරනු ලබන අයකිරීමත්, කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

5.15. නෛතික අවශ්‍යතාවක් ලෙස, කාඩ්පත භාවිත කරනු ලබන සෑම ගණුදෙණුවක් සඳහාම මුද්දර ගාස්තුවක් (රජයේ ගාස්තු) අය කෙරෙන අතර, එය කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ. කාඩ්පත හිමිකරුට/හිමිකාරියට පූර්ව දැනුම් දීමකින් තොරව, රජය හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන්නා වූ විධි විධානයන්ට අනුකූලව අදාළ ප්‍රමාණයන් පිළිබඳ සංශෝධනයන් කලින් කලට සිදු කෙරේ.

5.16. කාඩ්පත සහ කාඩ්පත භාවිත කිරීම සඳහා නියමිත ගාස්තු සහ වෙනත් මූල්‍ය අයකිරීම් පිළිබඳ විස්තර කාඩ්පත සමග යොමු කරනු ලැබේ. මීට අමතරව මහජන බැංකු වෙබ් අඩවියේ ද සඳහන් කරනු ලැබේ. සියළුම අයකිරීම්, ගාස්තු පොළී අනුපාත කාලානුරූපීව වෙනස් වීමට

පුළුවන. බදු අයකිරීම් පිළිබඳ වෙනස්කම්/එකතු කිරීම් කාඩ්පත් හිමිකරුට/හිමිකාරියට දන්වා සිටිනු ලැබේ.

## 6. බිල්පත් සහ ගෙවීම් කිරීම

6.1. සෑම බිල්පත් කාල සීමාවක් අවසානයේදීම (බිල් කටයුතු කාල පරිච්ඡේදය) අවසාන දිනයේ දී, පහත සඳහන් තොරතුරු සහිත ප්‍රකාශනයක් කාඩ්පත හිමිකරුට/හිමිකාරියට යොමු කෙරේ.

- ➢ කාඩ්පත් ගිණුමේ අයවිය යුතු ගෙවීම් (අයවිය යුතු මුළු ශේෂය)
- ➢ කාඩ්පත් හිමිකරුගෙන්/හිමිකාරියගෙන් වර්තමාන බිල් කටයුතු කාල පරිච්ඡේදයට අදාළව අයවිය යුතු අවම ශේෂය.
- ➢ අයවිය යුතු මුළු ගණනට අදාළව, පසුගිය අයවිය යුතු ගෙවීම්, සීමා ඉක්මවීම නිසා අයවිය යුතු ගෙවීම් මුළු අයවිය යුතු ගෙවීම් (අවම අයවිය යුතු ගෙවීම්)
- ➢ බැංකුවට ගෙවීම් කටයුතු සිදුකළ යුතු දිනය (ගෙවීම් සිදුකළ යුතු දිනය)

'අවම අයවිය යුතු මුදල' යනු අවසාන ශේෂයෙන් 5% ක් වේ. ප්‍රමාද ගාස්තු අයවීමෙන් වැළකී සිටීම සඳහා අදාළ ගෙවිය යුතු අවම මුදල, පසුගිය ගිණුම් ප්‍රකාශයේ හිඟ මුදලක් පවතී නම් ඒ මුදල සමග ද ගෙවිය යුතුය. ගෙවීම් කිරීම ඕනෑම මහජන බැංකු ශාඛාවකින්/සේවා මධ්‍යස්ථානයකින්/අන්තර්ජාල පහසුකම මගින්/SMS මගින් කළ හැකිය. ගෙවීමක් බැංකුවට ලද බව තහවුරු වන්නේ කාඩ් මධ්‍යස්ථානය විසින් සඳහන් කෙරෙන ලිපිනයට එය ලැබුණු විට සහ එය කාඩ්පත් ගිණුමට බැර කළ විටදීය. මුදලින් කාඩ්පත් ගිණුමට සිදු කරනු ලබන ගෙවීමකට අවම වශයෙන් එක් වැඩ කරන දිනයක් ගත වේ. චෙක්පතකින් නම් අවම වශයෙන් කාඩ් මධ්‍යස්ථානයට ලද දින සිට දින 2ක් ගත වේ. බිල් කටයුතු කාල පරිච්ඡේද කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් සිදු කරනු ලබන ඉල්ලීම් වලට අනුව හෝ බැංකුවේ අභිමතය පරිදි වෙනස් වේ. ගිවිසුම ප්‍රකාරව අදාළ දිනයන්ට සිදු නොකරන ලද අයවිය යුතු ගෙවීම් වල ප්‍රතිඵලයක් ලෙස පරිහරණය කළ හැකි මුදල අවම කිරීම හෝ ගණුදෙණු සීමා කිරීම සිදුවිය හැකිය.

6.2. අයවිය යුතු ගෙවීම් සඳහා වන නියමිත දිනයේදී, සිය අභිමතය පරිදි අවශ්‍ය මුදල් ප්‍රමාණයක් කාඩ්පත් ගිණුමට බැර කිරීම සඳහා කාඩ්පත් හිමිකරු/හිමිකාරිය විසින්, ස්වකීය ජංගම ගිණුමෙන් හෝ ඉතුරුම් ගිණුමෙන් ස්වයංක්‍රීය පියවීම් උපදෙස් (සෘජු හර උපදෙස්) කාඩ් මධ්‍යස්ථානය වෙත ලබා දිය හැකිය.

6.3. කාඩ්පත හිමිකරු/හිමිකාරිය, ස්වයංක්‍රීය පියවුම් උපදෙස් සඳහා සිදුකළ යුතු වෙනස්කම් හෝ අවලංගු කිරීම් හෝ ගෙවීම් සඳහා වන නියමිත දිනයට අවම වශයෙන් සතියකටවත් පෙර යොමු කිරීම කළ යුතු වේ.

6.4. කාඩ්පත් භාවිත කර, ශ්‍රී ලංකා මුදලින් හැර සිදු කරනු ලබන සියළුම විදේශීය මුදල් ගණුදෙණු කාඩ්පත් නියෝජිත සමාගම විසින් නිශ්චය කෙරෙන අදාළ දිනයට බලපාන්නා වූ විනිමය අනුපාතයකට අනුව ගණනය කර, එයට කාඩ්පත් සමාගම සහ/හෝ බැංකුව විසින් නියම කරනු ලබන අමතර ප්‍රතිශතයක් එකතු කර කාඩ්පත් ගිණුමට බැර කෙරේ.

6.5. ගුවන් ටිකට් පත්, හෝටල් වෙන් කිරීම්, මෝටර් රථ කුලී, නාවුක ගමන් ආදී මිලදී ගැනීම් සහ අවලංගු කිරීම් වෙනස් ගණුදෙණු වශයෙන් සැලකෙන හෙයින් ඒවා වෙළඳ බිල් යටතේ සිදු කළ මිලදී ගැනීමක් ලෙස සැලකේ. යම්කිසි ගණුදෙණුවක් අවලංගු කිරීමක් වෙතොත්, අදාළ විකුණුම්කරුවන් විසින් ආපසු ගෙවනු ලබන මුදල් කාඩ්පත් ගිණුමට (අවලංගු කිරීමේ ගාස්තු අඩු කර) බැර කරනු ලැබේ. මෙහිදී විදේශ විනිමය ගණුදෙණුවක් නම් බැර කරනු ලබන දිනට අදාළ විනිමය අනුපාතයට අදාළ වේ. එසේ කරනු ලබන්නේ අදාළ මුදල/මුදල් එකී විකුණුම්කාර ආයතන වලින් ලැබුණු විටකදී පමණි.

6.6. ගණුදෙණු අවලංගු කිරීම්, ප්‍රති සැකසුම් හෝ ප්‍රතිපූර්ණ මගින් සිදුවන සියළුම හුවමාරු අලාභ සඳහා කාඩ්පත හිමිකරු/හිමිකාරිය වගකීමට බැඳී සිටී.

6.7. කාඩ්පත හිමිකරු/හිමිකාරිය එක් මාසයකට වඩා වැඩි කාලයක් රටින් බැහැර වන අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ කාඩ්පත් ගිණුම පියවීමට අදාළ වන, පැහැදිලි සහ නිරවුල් උපදෙස්, විගමනයට පෙර, කාඩ් මධ්‍යස්ථානයට ලබා දිය යුතුය.

6.8. කාඩ්පත් ගිණුමට අදාලව නිකුත් කෙරෙන සෑම ප්‍රකාශනයක් ම, කාඩ්පත් හිමිකරු/හිමිකාරිය විසින් අවධානයෙන් කියවිය යුතු වන අතර එහිලා සිදුව තිබෙන කිසියම් දෝෂ වෙතොත් ඒවා ප්‍රකාශනය නිකුත් කර දින 20 ක් නික්ම යෑමට පෙර බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානයට ඉදිරිපත් කළ යුතු වේ. එම කාලය ඉකුත් වීමෙන් පසු, ප්‍රකාශනයේ ඇතුලත් කරන ලද සටහන් (දන්වන ලද දෝෂයන් හැර) බැංකුවට සහ කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් පොදුවේ නිවැරදි බවට එකඟ වනු ලැබේ. සෑම ප්‍රකාශනයක්ම, කාඩ්පත් හිමිකරු/හිමිකාරිය බැංකුව වෙත ලබා දී තිබෙන අවසාන ලිපිනයට, ලිඛිතව, සාමාන්‍ය තැපෑලෙන් යොමු කෙරෙන අතර, එය තැපැල් කළ දිනයේ සිට පැය 48 ක් ඇතුලත ඔහුට/ඇයට ලැබෙනු ඇතැයි උපකල්පනය කෙරේ.

අනුමැතියකින් තොරව සිදුකෙරී ඇතැයි සැලකෙන ලබන සියළුම ආරවුල් සහගත ගණුදෙණු පිළිබඳ තොරතුරු ඊලඟ බිල්පත් දිනයට පෙර බැංකුවට දැන්විය යුතුය.

6.9. කාඩ්පත් ප්‍රකාශනය නියමිත දිනට නොලැබුන විටදී, නොලැබුණු බව, අදාළ හිඟ ශේෂයක් ඇත්නම් ඒවා නොගෙවා සිටීමට සාධාරණ හේතුවක් ලෙස නොසැලකේ. එහෙත් ගාස්තු අයකිරීමකින් තොරව එම ගිණුම් ප්‍රකාශනය ලබා දීමට කාඩ් මධ්‍යස්ථානය එකඟ වේ.

## 7. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර [ATM] මගින් මුදල් ලබා ගැනීම

7.1. කාඩ්පතේ සඳහන් ජාත්‍යන්තර ලාංඡනය සහිත ඕනෑම ATM යන්ත්‍රයකින් මහජන බැංකුවේ කාඩ්පත් සහ එමATMයන්ත්‍රවලට බලපාන සීමාවන් යටතේ මුදල් ලබාගත හැකි වේ.

7.2. කාඩ්පත් හිමිකරු/හිමිකාරිය විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතයේදී උද්ගත විය හැකි ඕනෑම ආරවුල් සහගත තත්වයක් බැංකුව විසින් විමර්ශනය කෙරෙන අතර, ඒ පිළිබඳව බැංකුව සෑහීමකට පත් නොවන අවස්ථාවන්හිදී කාඩ්පත හිමිකරු/හිමිකාරියඑයට වගකිව යුතුය.

7.3. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතයේදී බැංකුවේ පරිගණක ක්‍රමය විසින් නිකුත් කෙරෙන තොරතුරු, කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් ගණුදෙණුව/ගණුදෙණු සිදුකර ඇති බවට පො දු සාක්ෂි වශයෙන් යොදා ගැනේ.

7.4. කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින්, ඔහුගේ/ඇයගේ අනුදැනුම සහිතව හෝ රහිතව හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිත කර සිදු කෙරෙන සියළුම ගණුදෙණු පිළිබඳ වගකීම දරණු ලැබේ. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් ගණුදෙණු කිරීමට, අදාළ කාඩ්පතේ පුද්ගලික රහස්‍ය අංකය අවශ්‍ය වන බැවින්, කාඩ්පත අස්ථානගත වීම වැනි හේතු නිසා කාඩ්පත හිමිකරු/හිමිකාරිය ඒ පිළිබඳ වගකීමෙන් බැහැර නොවන බව සැලකිය යුතුය. කාඩ්පත් හිමිකරු/හිමිකාරිය පුද්ගලික රහස්‍ය අංකය පිළිබඳ රහස්‍යභාවයන් ආරක්‍ෂා කාරීමට මෙන්ම කාඩ්පත සහ පුද්ගලික රහස්‍ය අංකය වෙන්ව තබා ගැනීමට වග බලා ගත යුතුය. කාඩ්පත හිමිකරු/හිමිකාරිය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිත කර මුදල් ලබා ගන්නා විටක, බැංකුව විසින් කාඩ්පත් ගිණුමට අදාල ගණන හර කරනු ලැබේ.

7.5. කාඩ්පත හිමිකරු/හිමිකාරිය කාඩ්පතේ ගිණුමට අදාළ සියළුම ගණුදෙණු පිළිබඳ බැංකු වාර්තාවන්/දත්තයන් ඕනෑම කරුණක් සඳහා තීරණාත්මක සහ බැඳීම් සහගත බවට පිළිගනී

7.6. කාඩ්පත් හිමිකරු/හිමිකාරිය විසින් පුද්ගල රහස්‍ය අංකය අන්‍යයන් වෙත හෙළිදරව් වීමට තිබෙන අවස්ථා, කාඩ්පතේ චුම්භක තීරුවේ අන්තර්ගත කර තිබෙන කාඩ්පතේ දත්ත සහ/හෝ චිප් කොටසේ අන්තර්ගත කර තිබෙන කාඩ්පතේ දත්ත කාඩ්පතේ ආරක්‍ෂාව පිණිස අනුගමනය කළ යුතු සියළුම අවශ්‍යතාවයන් පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

7.7. කාඩ්පත හිමිකරු/හිමිකාරිය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයකින් **[ATM],** බැංකුවේ ශාඛාවකින්, නියෝජිත ආයතනයකින් මුදල් අත්තිකාරම් ලබා ගන්නා විට ඒවා රටේ සීමාවන්ට සහ ප්‍රමාණයන්ට අනුව සිදුවේ. මහ බැංකුවේ සහ විනිමය හුවමාරු පනතේ විධි විධානයන්ට ද යටත් වේ. මහජන බැංකුවේ අන්තර්ජාතික ණයවර කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ මුදල් අත්තිකාරම් ලබා ගැනීම ණය කාඩ්පත් වලට අදාළ ස්ථාවර සීමාවන්ට/ප්‍රතිශතයන්ට යටත්ව සිදු වේ. තාවකාලික සීමා ඉහළ දැමීම සහ/හෝ මූල්‍ය තැන්පතු හෝ ණය කාඩ්පත් ගිණුම්වලට මාරු කිරීම් මගින් ණය කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ මුදල් අත්තිකාරම් සීමා ඉහළ දැමීමක් සිදු නොවේ.

7.8. කාඩ්පත හිමිකරුට/හිමිකාරියට පූර්ව දැනුම් දීමකින් තොරව මේ පහසුකම් වෙනස් කිරීමට හෝ අත්හිටුවීමේ බලය බැංකුව සතු වේ.

## 8. කාඩ්පත අස්ථානගත වීම

8.1. කාඩ්පත අස්ථානගත වීම, සොරා ගැනීම, පුද්ගල රහස්‍ය අංකය අන්‍යයන්ට හෙළිදරව් වීම, අස්ථාන ගත වු කාඩ්පතක් නැවත සොයා ගැනීම වැනි කරුණු දුරකථන හෝ ෆැක්ස් හෝ මගින් වහා කාඩ්පත් මධ්‍යස්ථානයට දැන්විය යුතු වන අතර ඊට අමතරව ලිඛිතව කාඩ්පත් මධ්‍යස්ථානයට දැන්විය යුතු වේ. (විදේශයකදී නම්, ජාත්‍යන්තර කාඩ්පත්නියෝජිත කාර්යාලයට දැන්විය යුතුය) දුරකථන හෝ ෆැක්ස් හෝ මාර්ගයෙන් සිදු කෙරෙන දැනුම් දීමකදී නම්, එය කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ හෝ බලය පවරන ලද ඇටෝර්නිවරයකුගේ අත්සන සහිත ලිඛිත සටහනකින් ද තහවුරු කළ යුතුය. එවැනි විටක, ඉහත සඳහන් පරිදි හෝ ජාත්‍යන්තර කාඩ්පත් සාමාජිකයකු ලෙස හෝ අස්ථානගත වීම/සොරකම් කිරීම පිළිබඳ තොරතුරු ලිඛිතව ද දන්වා තහවුරු කරන තෙක්, බලය නොපවරන ලද පරිහරණයන් මගින් කාඩ්පත් ගිණුමට හර වන සියලු ගණුදෙණු පිළිබඳ වගකීමට, කාඩ්පත හිමිකරු/හිමිකාරිය බැඳී සිටී. අස්ථානගත වූ කාඩ්පත/කාඩ්පත් නැවත හමු වු වහා ම බැංකුවට භාර දිය යුතුය.

8.2. අස්ථානගත වීම්, සොරකම් කිරීම සහ අපහරණයන් සිදුවිය හැකි බැවින් කාඩ්පත හිමිකරු/හිමිකාරිය කාඩ්පත හිමිකාරිත්වය පිළිබඳ සියලු තොරතුරු බැංකුවට භාරදිය යුතුය. ඒ අනුව එවැනි අවස්ථවන්හිදී අස්ථානගත වු කාඩ්පත නැවත සොයා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට බැංකුවට හැකියාව ලැබෙනු ඇත.

8.3. අස්ථානගත වීම්, නැති වීම හෝ සොරකම් කිරීම වැනි අවස්ථාවන්හිදී අවශ්‍ය වන්නේ නම්, අලුත් කාඩ්පතක් නිකුත් කිරීම සිදුකෙරේ. එවැනි විටක මුල් කාඩ්පත නිකුත් කිරීමේදී සඳහන් කෙරෙන කොන්දේසි සහ නියමයන් අදාළ වන අතර ගාස්තුවක් බැංකුව විසින් තීරණය කරනු ලබන ගාස්තුව කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

## 9. කාඩ්පතේ වලංගුභාවය, කල් ඉකුත් වීම සහ නැවත අලුත් කිරීම

9.1. සෑම කාඩ්පතක් ම සාමාන්‍යයෙන් වසර 02 ක කාල සීමාවක් සඳහා නිකුත් කෙරේ. බැංකුවේ අභිමතය පරිදි මෙම කාල සීමාව අඩු හෝ වැඩි වන ආකාරයට කාඩ්පත් නිකුත් කිරීම සිදු කිරීමට හැකියාව ඇත. කාඩ්පතේ සඳහන් වන අවසන් මාසයේ අවසන් දිනයේදී  කාඩ්පතේ කල් ඉකුත් වේ.

9.2. තාක්ෂණික දෝෂයක් නිසා කාඩ්පත ක්‍රියාත්මක නොවේ නම් කාඩ් මධ්‍යස්ථානය වෙත දැන්විය යුතු අතර ඒ සඳහා නව කාඩ්පතක් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

9.3. කාඩ්පත් හිමිකරු/හිමිකාරියගේ ඉල්ලීම පරිදි කල් ඉකුත් වීමට පෙර නව කාඩ්පතක් නිකුත් කිරීම බැංකුවේ අභිමතය පරිදි සිදුකළ හැකිය.

9.4. කිසියම් කොන්දේසි සහ නියමයන් කඩ කිරීමක් සිදු නොවන විටක, බැංකුව මගින් ස්වයංක්‍රීය ලෙස කාඩ්පතේ වලංගුභාවය අලුත් කෙරෙන අතර, (එය අතිරේක කාඩ්පත් වලටද අදාල වේ) සාමාන්‍යයෙන් භාවිත කරමින් තිබෙන කාඩ්පත් කල් ඉකුත් වීමට පෙර ඒවා කාඩ්පත් හිමිකරු විසින් දැනුම් දී ඇති ශාඛාවකට/කාඩ් මධ්‍යස්ථානයට යොමු කරනු ලැබේ. එලෙස අලුත් කරන ලද

කාඩ්පත/කාඩ්පත් නියමිත පරිදි නොලැබුණ විටක කාඩ් ඇමතුම් මධ්‍යස්ථානයෙන් විමසීම් කළ යුතුය.

9.5. කාඩ්පත් වලංගු කාලසීමාව තුල, අවසන් මාස 06 තුල ගෙවීම් අක්‍රමික වන්නේ නම් කාඩ්පත ස්වයංක්‍රීයව අලුත් කිරීම සිදු නොකරන අතර එවැනි අවස්ථාවකදී කාඩ්පත ලබාදීම සඳහා ගණුදෙණුකරු විසින් ඉල්ලීමක් කළ යුතු අතර නව ආදායම් තහවුරුවක් සහිතව ණය තොරතුරු කාර්යාංශයේ බැඳීම් පරීක්ෂා කිරීමට යටත්ව කාඩ්පතක් නිකුත් කරීමට සලකා බලනු ලැබේ. මෙවැනි අවස්ථාවක කාඩ්පත නිකුත් කිරීමට හෝ නොකිරීමට සහ අදාළ ණය සීමාව තීරණය කිරීමට බැංකුවට බලය ඇත.

9.6. කාඩ්පත හිමිකරු/හිමිකාරිය වලංගු කාලය ඉකුත් වූ පසුව කාඩ්පත් භාවිත කිරීමෙන් වැළකී සිටිය යුතුය. එසේ වලංගු කාලයෙන් බැහැරව කාඩ්පත් භාවිත කිරීමෙන් උද්ගත වන්නා වූ කවර හෝ පසුව ඇතිවන තත්වයකට වගකීම සඳහා බැංකුව බැඳී නොසිටී.

## 10. කාඩ්පත අවලංගු කිරීම

10.1. කාඩ්පත හිමිකරු/හිමිකාරිය අවශ්‍ය ඕනෑම විටක මේ ගිවිසුම අහෝසි කළ හැකිය. එහිදී ලිඛිතව ඒ බව බැංකුවට දැනුම් දීම අවශ්‍ය වන අතර, කාඩ්පත මෙන්ම අතිරේක කාඩ්පත් යළි භාරදීම සිදුකළ යුතුය. මෙම ගිවිසුම අතිරේක කාඩ්පත් භාවිත කරන්නන්ටද බලපාන බැවින්, ගිවිසුම අහෝසි කිරීමේදී ඒ පිළිබඳය ද ලිඛිතව සඳහන් කිරීම අවශ්‍යය. යළි භාරදෙනු ලබන කාඩ්පත සහ අතිරේක කාඩ්පත/කාඩ්පත් දෙකට කපා වෙන් කළ යුතුය.

10.2. අවශ්‍ය ඕනෑම විටක, කාඩ්පත අලුත් කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම ඊට බලපාන්නා වූ හේතු පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව හෝ බැංකුවට මෙම ගිවිසුම අහෝසි කළ හැක. එබඳු තත්වයක් උද්ගත නොවන තෙක් බැංකුව විසින් කලින් කලට කාඩ්පත/කාඩ්පත් හිමිකරුට/හිමිකාරියට අලුත් කාඩ්පත් නිකුත් කිරීමට කටයුතු යොදනු ලැබේ.

10.3. මුළු අයවිය යුතු ගණන ඇතුළු කාඩ්පත් ගිණුමට හර නොකරන ලද හෝ අයවිය යුතු සියළු ගණුදෙණු ගිවිසුම අහෝසි කිරීමේදී හෝ කාඩ්පත් හිමිකරුගේ/හිමිකාරියගේ බංකොලොත් වීමකදී/අභාවයකදී, වහා අයවිය යුතු ශේෂයන් බවට පත් වේ. එහිදී කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ හෝ ඔහුගේ/ඇයගේ වත්කමෙන් කාඩ්පත් ගිණුමේ අයවිය යුතු ගණන පියවීම සඳහා වගකීමෙන් බැඳේ. එම ශේෂය අයකර ගැනීමේදී බැංකුවට දැරීමට සිදුවන සියළු පිරිවැය, ගාස්තු (නීති ගාස්තු ඇතුළු) මුළු වියදම, අලාභ වශයෙන් සලකා කටයුතු කරනු ලැබේ. යම් අයවිය යුතු ගණනක් ගෙවා නිම කරන තෙක් මූල්‍ය ගාස්තු සහ වෙනත් අයකිරීම් පවතින ප්‍රතිශතයන්ට අනුව අඛණ්ඩව අයකර ගැනීමේ අයිතිය බැංකුව සතු වේ.

10.4. දෙපාර්ශවයෙන් කුමන පාර්ශවයක් විසින් ගිවිසුම අහෝසි කරන තෙක්, කාඩ්පත් පරිහරණය කිරීම නිසා දරන්නට සිදුවන සෑම ගාස්තුවක්ම හා අයකිරීමක්ම ගෙවීමට කාඩ්පත හිමිකරු/හිමිකාරිය බැඳේ.

10.5. ගෙවීම් පැහැර හැරීම් හෝ ව්‍යාජ ගණුදෙණු සිදුවීම හේතුවෙන් හෝ නීති විරෝධි ගණුදෙණු හේතුවෙන් අවශ්‍ය අවස්ථා වලදී කාඩ්පත් අවලංගු කිරීමේ බලය බැංකුව සතු වේ.

## 11. පැහැර හරින ලද ගෙවීම් අයකර ගැනීම

11.1. යම් නොගෙවන ලද ගෙවීමක් වෙතොත් එය අයකර ගැනීම සඳහා, බැංකුව වෙත ලබා දී තිබෙන ඇමතුම් අංක මගින් කාඩ්පත් හිමිකරු/හිමිකාරිය සම්බන්ධ කර ගැනීමට බැංකුව උත්සාහ දරණු ලැබේ. කාඩ්පත හිමිකරු/හිමිකාරිය අදාළ ගෙවීම් පියවීමට අපොහොසත් වන විටක අවසාන වරට කාඩ් මධ්‍යස්ථානය වෙත සඳහන් කර තිබෙන ලිපිනයට අනුව ඔහුට/ඇයට ලිඛිතව දැන්වීමට කටයුතු කරනු ලැබේ. එසේ සිදුකරන ලද ඇමතුම්වලට සහ ලිඛිත දැනුම් දීම්වලට කාඩ්පත හිමිකරු/හිමිකාරිය අදාළ ගෙවීම පියවීමට පියවර නොගන්නේ නම්, සඳහන් කර ඇති ලිපිනයට අනුව සොයා යමින් ඔහු/ඇය මුණ ගැසීමට ද බැංකුවට අයිතිය ඇත.

11.2.බැංකුවට සිය පූර්ණ අභිමතය පරිදි, කාඩ්පත් ගිණුමේ සඳහන් අයවිය යුතු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ අයකිරීම් සඳහා තුන්වෙනි පාර්ශවයක අයකිරීමේ ඒජන්තවරයෙකුට පැවරීමට බලය ඇත. අයවිය යුතු මුදල, එහි පොලිය සහ අදාළ සියළුම වියදම්, නීති ගාස්තු, අයකිරීමේ ගාස්තු සහඒජන්තවරයෙකුට අවශ්‍ය වන්නේ නම්,අයකිරීම සඳහා බලය යොදන්නට සිදුවන සියළු වියදම් කාඩ්පත හිමිකරු/හිමිකාරිය දැරිය යුතුය.

11.3.ගෙවීම් පැහැර හරින ලද අවස්ථාවක කාඩ්පත හිමිකරු/හිමිකාරිය මහජන බැංකුවේ පවත්වනු ලබන ඕනෑම ගිණුමකින් එම මුදල අයකර ගැනීමේ අයිතිය බැංකුවට ඇත.

## 12. කාඩ්පත සම්බන්ධ ආරවුල් නිරාකරණය

12.1.කාඩ්පත හිමිකරු/හිමිකාරිය යම් කාඩ්පත් ගණුදෙණු සම්බන්ධ ගැටළුවකට මුහුණ දී තිබේ නම් ඒ බව ඔහු/ඇය විසින් ඊළඟ බිල්පත් දිනයට (උපරිම දින 20 කට ප්‍රථම) කාඩ්පත් මධ්‍යස්ථානයට දැන්විය යුතුය. ඒ පිළිබඳ විමර්ශන කටයුතු සිදුකිරීම සඳහා කාඩ්පත හිමිකරු/හිමිකාරිය බැංකුවට පහත සඳහන් තොරතුරු ලබාදීමෙන් සහයෝගය දැක්විය යුතුය. කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ නම, කාඩ්පත් අංකය ආරවුල් සහගත ගණුදෙණුවේ විස්තර ආරවුල් සහගත මූල්‍ය වටිනාකම, එසේ විමර්ශනය කිරීමෙන් පසු එය නීතිවිරෝධී ගණුදෙණුවක් ලෙස බැංකුවට ඒත්තු යන්නේ නම් අදාළ ගණන ප්‍රතිපූරණය කිරීමට බැංකුව කටයුතු කරයි. එවැනි විටක කාඩ්පත හිමිකරු/හිමිකාරිය බැංකුවට විමර්ශනය කිරීමට අදාළ සහයෝගය ලබා නොදෙන්නේ නම්, ආරක්ෂිත කැමරා පද්ධතිය හෝ අලෙවි කුටිය විමර්ශනය බලාපොරොත්තු නොවන්නේ නම් හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය **[ATM]** විමර්ශනය කිරීමට බලාපොරොත්තු නොවෙන්නේ නම් හෝ ඔහු/ඇය ඒ ආකාරයෙන් සිදු වූ සියළුම ආරවුල් ගණුදෙණු සඳහා කාඩ්පත් හිමියා වගකීමෙන් බැඳී සිටී.

ආරවුල් සහගත ගණුදෙණුවට තමන්ගේ සම්බන්ධතාවයක් නොමැති බවට සඳහන් කෙරෙන ප්‍රකාශනයක් සමග පොලිස් ස්ථානයකට ඉදිරිපත් කරන ලද පැමිණිල්ලේ පිටපතක් හෝ, එය විදේශයකදී සිදු වූයේ නම්, ගමන් බලපත්‍රයේ සියළු පිටු දැක්වෙන පිටපතක් ද සහිතව කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් බැංකුවට ඉදිරිපත් කළගැනීමට කටයුතු කරනු ඇත.

12.2.අදාළ සිදුවීම වාචිකව දන්වන ලද අවස්ථාවක, එහි පිටපතක් වැඩ කරන දින 5ක් ඇතුලත බැංකුවට ලබාදිය යුතුය. වැඩි විස්තර අවශ්‍ය වන අවස්ථාවක බැංකුව විසින් කාඩ්පත හිමිකරුගෙන්/හිමිකාරියගෙන් තොරතුරු ලබා ගැනේ.

12.3.තම කාඩ්පතේ දත්ත තම අනුදැනුමකින් තොරව සොරකම්කර ව්‍යාජ ලෙස සකසන ලද කාඩ්පතකින් කරන ලද ගණුදෙණු පිළිබඳ වහාම කාඩ් මධ්‍යස්ථානය දැනුවත් කළ යුතු අතර සියළුම තත්වයන් තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඒ සම්බන්ධ ප්‍රතිපූර්ණ ලබා දීමට කාඩ් මධ්‍යස්ථානය අවශ්‍ය  කටයුතු කරනු ඇත.

## 13. ණය තොරතුරු කාර්යංශයට [CRIB] තොරතුරු වාර්තා කිරීමේ ක්‍රියාවලිය

අවශ්‍ය විටක ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශයට **[CRIB]**හෝ වෙනත් දේශීය හෝ විදේශීය ණය තොරතුරු කාර්යංශයකට කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ නම සහ වෙනත් තොරතුරු වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ මගින් බැංකු ඇතුළු සෙසු මූල්‍ය ආයතනයන්ට අදාළ පුද්ගලයන්ගේ තොරතුරු ලබා ගැනීමට හැකියාව ලැබේ. මේ වූ කලී නෛතික අවශ්‍යතාවයකි. අඛණ්ඩව නොගෙවා සිටීම නිසා කාඩ්පත් ගිණුම අවලංගු කෙරෙන අතර, පවතින අවම අයවිය යුතු ගණන වහා පියවීමට කටයුතු නොකරන්නේ නම්, ඉන් පසු සියලු ගණුදෙණු අවලංගු කිරීමට පියවර ගැනේ. ඒ අනුව අතිරේක කාඩ්පත් ද අවලංගු වේ. ඒවා අවලංගු වූ වහාම කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් කාඩ්පත/කාඩ්පත් විනාශ කර දැමීමට කටයුතු කළ යුතුය. කාඩ්පත/කාඩ්පත් අවලංගු කිරීම පහත සඳහන් ආකාරයට සිදු කෙරෙනු ඇත.

I. කාඩ්පත/කාඩ්පත් නැවත අලුත් නොකිරීමෙන්

II. නෛතික අවශ්‍යතාවයක් ලෙස කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ නම සහ වෙනත් තොරතුරු බැංකු ඇතුළු සෙසු මූල්‍ය ආයතනයන්ට ලබාගත හැකිවන පරිදි ණය තොරතුරු කාර්යංශයට ලබාදීමෙන්

III. බැංකුව සිය අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීම සඳහා නෛතික පියවරයන්ට යොමු වීමෙන්

## 14. තොරතුරු හෙළිදරව් කිරීම

14.1.බැංකුවට අවශ්‍ය වේ යැයි හැඟෙන වෙනත් ණය කාඩ්පත් සමාගම් වලට බැංකු වලට සහ නෛතික තත්වයන් යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, අධිකරණයට හෝ රජයේ දෙපාර්තමේන්තු වලට හෝ අධිකාරි ආයතනයන්ට, කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ කාඩ්පත්/අතිරේක කාඩ්පත් ගිණුම් පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමේ අධිකාරී බලය, කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් බැංකුව සතු කරන අතර අයිතිය බැංකුව සතුය. මෙම බලය කාඩ්පත හිමිකරු/හිමිකාරිය බැංකුව හා බැංකුව හා සම්බන්ධකම් නොපවත්වන කාල පරිච්ඡේදයන්ටද අදාළ වේ.

14.2.කාඩ්පත හිමිකරුට/හිමිකාරියට අයත් කාඩ්පත් ගිණුමට අදාළ තොරතුරු බැංකුවේ අභිමතය පරිදි ණය තොරතුරු කාර්යංශයට සහ/හෝ දේශීය/විදේශීය ණය තොරතුරු කාර්යංශයන්ට දැන්වීමේ අයිතිය බැංකුව සතුය.

## 15. ශ්‍රී ලංකා මහ බැංකු වේ උපදෙස්, වෙනත් අණපනත් සහ විනිමය පාලන නීතිරීති

15.1.ණය කාඩ්පත් නිකුත් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒ හා සම්බන්ධ ඕනෑම කටයුත්තක් සඳහා අදාළ වන ශ්‍රී ලංකාවේ අණපනත්, නීති රීති මහජන බැංකු ණයකාඩ්පත් සඳහා ද අදාළ වේ.

15.2.ණයකාඩ්පත් නිකුත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් වලට අනුකූලව සිදුකරනු ඇත.

15.3.කාඩ්පත් හිමිකරු/හිමිකාරිය සෑම විට විනිමය පාලන පනතේ සඳහන් වන මෙහෙයුම් උපදෙස්, රෙගුලාසි සහ නීති රීතීන්ට එකඟව කටයුතු කිරීමට සැම විටම වග බලාගත යුතුය.

15.4.කාඩ්පත් හිමිකරු/හිමිකාරිය කාඩ්පත/කාඩ්පත් භාවිත කර ප්‍රාග්ධන ගණුදෙණු සඳහා වාණිජ භාණ්ඩ වශයෙන් භාණ්ඩ මිලදී ගැනීම/ආනයනය කිරීම සිදු නොකිරීමට වගබලා ගතයුතුය. කාඩ්පත හිමිකරු/හිමිකාරිය විදේශ රැකියාවකට පිටත්ව යන විට හෝ අදාළ කාල සීමාවෙහි බලපවත්වන විනිමය පාලන නීති රීතීන්ට අනුව ඔහු/ඇය අනේවාසික ගණයට අයත් වන විටක, කාඩ්පත/කාඩ්පත් බැංකුවට භාර දීමට කටයුතු කළ යුතුයි. තවදුරටත් කාඩ්පත ඔහු/ඇය විසින් පරිහරණය කිරීමට ඉල්ලා සිටින්නේ නම්, මහ බැංකුවේ විනිමය පාලන යටතේ මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අනේවාසික ගිණුමක් මගින් මාසික කාඩ්පත් ගෙවුම් යොමු කිරීමට කටයුතු කළ යුතුය. (2005 සැප්තැම්බර් 19 වැනි දින අංක 1411/5 දරණ ගැසට් නිවේදනය)

15.5.කාඩ්පත් හිමියා සෑම විටම විදේශ මුදල් වලින් බිල්ගත කරන, ගණුදෙණු සඳහා කාඩ්පත භාවිත කළ යුත්තේ හෝටල් ගාස්තු, හදිසි ගෙවීම්, වෛද්‍ය ප්‍රතිකාර වියදම්, සංචාරක ගාස්තු, පෞද්ගලික පරිභණය සඳහා භාණ්ඩ මිලදී ගැනීම වැනි පෞද්ගලික වියදම් සඳහා පමණි. ප්‍රාග්ධන ගණුදෙණු සඳහා හා වාණිජ පරිමාණයෙන් භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන ගෙවීම් සඳහා කාඩ්පත භාවිත නොකළ යුතුය.

15.6.කාඩ්පත හිමිකරු/හිමිකාරිය විදේශයකට සංක්‍රමණය වන විට, විදේශ රැකියාවකට පිටත් වන විට හෝ විනිමය පාලන පනතට අනුව හෝ ඒ වන විට බලපවත්වන නීති ප්‍රකාරව, අනේවාසික ගණයට අයත් වන විට හෝ කාඩ්පත/කාඩ්පත් බැංකුවට ආපසු භාර දීමට කටයුතු කළ යුතුය. කලින් කලට පනවනු ලබන සහ බලාත්මක කෙරෙන විනිමය හුවමාරු විධි විධානයන්ට අනුව අදාළ තොරතුරු වාර්තා කිරීමට බැංකුව විසින් පියවර ගනු ලැබේ.

15.7. විනිමය හුවමාරු පනතේ හෝ කාලානුරූප ව බලාත්මක කර තිබෙන විධි විධානයන්ට එරෙහිව කාඩ්පත හිමිකරු/හිමිකාරිය කටයුතු කර තිබෙන විටක හෝ විනිමය පාලන රෙගුලාසි උල්ලංඝනය කිරීමක් සිදු වූවා යැයි බැංකුවට හැඟෙන විට විශ්වාස කළ හැකි යම් හේතුවක් ඇති විට, බැංකුව ඒක පාර්ශවිකව, පූර්ව දැන්වීමකින් තොරව කාඩ්පත/කාඩ්පත් අවලංගු කෙරේ.

## 16. නෛතික ප්‍රතිපාදන

මෙම කොන්දේසි සහ නියමයන්ට අනුව කටයුතු කිරීමට කාඩ්පත් හිමිකරුට/හිමිකාරියට නොහැකි වුවහොත් හෝ අපොහොසත් වුවහොත් කාඩ්පත් හිමිකරුගේ/හිමිකාරියගේ කාඩ්පත් ගිවිසුම අවලංගු කිරීමට බැංකුව කටයුතු කරනු ඇත. එවැනි විටක හානිපූර්ණ පදනම යටතේ බැංකුව විසින් දරනු ලබන සියළුම නෛතික වියදම් ලෙස සැලකිය හැකි වියදම්, අයකිරීම් සහ ගාස්තු පිළිබඳ සියළු වගකීම් සහ ගෙවීම් වලට කාඩ්පත් හිමිකරු/හිමිකාරිය බැඳී සිටී.

## 17. නීති රීති වල වෙනස් වීම

17.1. මෙහි සඳහන් කෙරෙන කොන්දේසි සහ නියමයන් කලින් කලට කාඩ්පත් ප්‍රකාශනයේ ඇතුළත් කරමින් හෝ වෙනත් ලේඛන මාර්ගයෙන් හෝ කාඩ්පත් හිමිකරුට/හිමිකාරියට දන්වමින් අවශ්‍ය වෙතොත් වෙනස් කිරීමේ හෝ නව කොන්දේසි සහ නියමයන් පැනවීමේ අයිතිය බැංකුව සතුය. අය කිරීම් සහ සේවා ගාස්තු සංශෝධනය කිරීම හෝ නව ගාස්තු හඳුන්වාදීම, කාඩ්පත නිරුපද්‍රිතව පරිහරණය කිරීම මගින් කවර හෝ පරිවර්තනයකට ලක් නොකර කාඩ්පත හිමිකරු/හිමිකාරිය ඒ නව හඳුන්වාදීම් වලට එකඟ වන බව බැංකුව පිළිගනී. එවැනි සංශෝධනයන්/නව හඳුන්වාදීම් පිළි නොගන්නා විටක ගිවිසුම අවලංගු කිරීමට කාඩ්පත/අතිරේක කාඩ්පත් සමග බැංකුවට ආපසු භාර දිය යුතුය.

17.2. තවදුරටත් කාඩ්පත/අතිරේක කාඩ්පත් ගණුදෙණු සඳහා පරිහරණය කිරීමෙන් (මෙම ගිවිසුම අහෝසි වීමත් නොතකා) කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් බැංකුවට වන්දි පූර්ණය කළ යුතුය.

## 18. කොන්දේසි සහ නියමයන්ගේ බලපැවැත්ම

18.1. මෙම ගිවිසුමේ සඳහන් වන කරුණු ගිවිසුම අහෝසි වීමෙන් පසුව ද, කාඩ්පත/කාඩ්පත් භාවිතයෙන් කරන ගණුදෙණු මගින් කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ සහ අතිරේක කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ ණය ශේෂයන්ට බලපාන ආකාරයට පූර්ණ බලයකින් අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

18.2. මෙම කොන්දේසි වලට සහ නියමයන්ට වෙන් වෙන් ක්‍රියාකාරීත්වයක් පවතී. ඒ අනුව යම් විටක එක් කොන්දේසියක් හෝ නියමයක් හෝ කිහිපයක් හෝ අවලංගු වුවහොත්, නීතියට පටහැනි වුවහොත්, බලපවත්වන්නට නොහැකි වුවහොත්, සෙසු කොන්දේසි සහ නියමයන් පැවැත්මට එය කිසි ලෙසකින්වත් අදාළ නොවේ. මෙම කොන්දේසි සහ නියමයන් සංශෝධනය කිරීමේ සහ ප්‍රතිශෝධනය කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී. පසු විපරම හෝ සංශෝධනය බැංකුවේ පූර්ණ අභිමතය පරිදි වේ.

18.3. ණය කාඩ්පත් නිකුත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාවේ නෛතික විධි විධානයන්ට අනුව සිදු වේ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව, රජයේ නීති රීති හෝ උපදෙස් මගින් යම් සංශෝධනයන් සිදු කෙරෙන විට, ඒවා මෙම කොන්දේසි වලට සහ නියමයන්ට ද බලපෑ හැකිය. කාඩ්පත සහ කාඩ්පත් ගිණුම පරිහරණය කිරීමේ අයිතිය වෙනත් පුද්ගලයකුගේ වෙනත් අරමුණු සඳහා පවරනු ලැබූ අවස්ථාවක, ඒ නිසා ඇති වන සියළුම මූල්‍ය වියදම් බැංකුවට, කාඩ්පත් නියෝජිත ආයතනයන්ට ගෙවීම පිළිබඳ වගකීම කාඩ්පත හිමිකරුට/හිමිකාරියට පැවරේ.

## 19. ව්‍යාතිරේඛයන්

19.1.වෙනත් බැංකුවක උපරිම සහ බලාත්මක කරන ලද මුදල් ලබා ගැනීමේ සීමාවන්ට යටත්ව, මුදල් අත්තිකාරම් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් මුදල් ලබා ගැනීම නිසා බලාත්මක කරන ලද උපරිම සීමාවන්ට යටත්ව හෝ වෙළඳ ව්‍යාපාරයකදී ගණුදෙණුවකදී කාඩ්පත පිළිනොගැනීමෙන් ඇති වන්නා වූ කුමන තත්වයකදී වුවද බැංකුව වගකියනු නොලැබේ.

19.2.කාඩ්පත හෝ කාඩ්පතේ අංකය හෝ භාවිත කරමින් මිලදී ගනු ලබන භාණ්ඩ සහ/හෝ සේවාවන්ට සිදුවන හානි හෝ අලාභ හෝ සඳහා වගකීමට බැංකුව කවරාකාරයකින්වත් වගකියනු නොලැබේ. එසේම වෙළඳ දැන්වීම් වල හෝ සඟරා, වාර ප්‍රකාශන, තැපැල් ඇනවුම් පත්‍රිකා, ප්‍රවර්ධන පත්‍රිකා හෝ භාණ්ඩ සේවාවන් අලෙවියට හෝ පරිභෝජනයට හෝ එළ කෙරෙන ප්‍රකාශන, වචන, පින්තූර හෝ වෙනත් නියෝජනයන් සඳහා වගකීමට බැංකුව කවරාකාරයකින්වත් වගකියනු නොලැබේ. වෙළඳාම් කටයුතු නිසා ඉදිරිපත් වන පැමිණිලි වෙතොත් ඒවා බැංකුවේ වගකීමට බල නොපාන ආකාරයට වෙළඳ ව්‍යාපාරයන් සමග සාකච්ඡා කර විසඳාගත යුතුය.

19.3.බැංකුවේ පාලනයෙන් පරිබාහිරව පවතින ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හෝ සන්නිවේදන ජාල හෝ දත්ත සැකසුම් ක්‍රියාවලි හෝ විකාශන සම්බන්ධතා හෝ කාර්මික හෝ වෙනත් ආරවුල් හෝ සෙසු ඕනෑම හේතුවක් නිසා උද්ගත වන ඕනෑම ස්වභාවික අපහසුතා, අලාභ හානි පාඩු හෝ දුෂ්කරතා සඳහා කිසිදු වගකීමකට බැංකුව කවරාකාරයකින්වත් බැඳී නොසිටී.

19.4.කාඩ්පත් විස්තර ප්‍රකාශනයේ දිනය සහ ගෙවීම් නියමිත දිනය වශයෙන් බැංකුව එක් දිනයක් තොරාගනු ලැබේ. බැංකුව කාඩ්පත හිමිකරුට/හිමිකාරියට විස්තරය යොමු කිරීමට අසමත් වූ විටකදීත් කාඩ්පත හිමිකරුගෙන්/හිමිකාරියගෙන් අයවිය යුතු මූල්‍ය ගාස්තු ගෙවුම් සඳහා කාඩ්පත් හිමිකරු/හිමිකාරිය වගකීමෙන් බැඳී සිටී.

19.5.කාඩ්පත් මුද්‍රණය කර හෝ වෙනත් ආකාරයකින් හෝ කාවැද්දූ කේතනය කරන ලද තොරතුරු සඳහන් විකුණුම් සටහන්, ගණුදෙණු පත්‍රිකා, ණය වවුචර, මුදල් ගෙවුම් පත්‍රිකා වෙනත් ගාස්තු ලේඛන ආදිය සඳහා නිසි ලෙස ගෙවීම් සිදුකිරීමට බැංකුවට බලය ඇත. බැංකු ක්‍රියාවලියේදී එවැනි වාර්තාවන්හි සඳහන් අන්තර්ගතයන් හෝ අත්සන් හෝ තහවුරු කර ගැනීමේ වගකීමට බැංකුව බැඳී නොසිටී. කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් අත්සන් කරන ලද හෝ නොකරන ලද විකුණුම් හෝ මුදල් ලබා ගැනීමේ වවුචර් පත් සඳහා මුදල් ගෙවීමට කාඩ්පත් හිමිකරු/හිමිකාරිය බැඳී සිටී.

19.6.බැංකු වාර්තා විකුණුම් තීරු සහ ගණුදෙණු ගිණුම් විස්තර පිළිබඳ පූර්ණ වගකීම කාඩ්පත් හිමිකරුට/හිමිකාරියට පැවරෙන බව ඔහු/ඇය පිළිගනී.

19.7.වෙළඳ දැන්වීම්කරුවන් හෝ බැංකුව හෝ පළ කරන සේවා, නිෂ්පාදන හෝ ප්‍රතිලාභ මගින් ජනිත වන දීමනා නිෂ්පාදන හෝ ප්‍රතිලාභවල යම් අසමත්මක් හෝ ප්‍රතිලාභ නොලැබීමේ ගැටළුවක් නිසා කාඩ්පත් හිමිකරුට/හිමිකාරියට ඇති විය හැකි අලාභයන් හෝ ලැබිය යුතු දීමනාවලට බැංකුව කවරාකාරයකින්වත් බැඳී නොසිටී.

## 20. පොදු කරුණු

20.1. කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ රැකියාවේ, රැකියා ස්ථානයේ හෝ ස්ථාන ලිපිනයේ හෝ දුරකථන අංකයන්හි (ජංගම සහ ස්ථාවර) හෝ ඊමේල් ලිපිනයන් හි වෙනස්කම් ඇති වුවහොත් ඒවා නිසි පරිදි බැංකුවට දැන්විය යුතුය.

20.2. ඕනෑම දැනුම් දීමක් සඳහා, බැංකුව කාඩ්පත හිමිකරු/හිමිකාරිය විසින් අවසානයට ලබා දී තිබෙන ලිපිනයට තැපැල් මගින් යොමු කෙරෙන අතර, එවැන්නක් තැපැල් කර පැය 48 ක් ඇතුළත ලැබෙන බවට බැංකුව උපකල්පනය කරයි.

20.3. බැංකුව අවශ්‍ය යැයි නිගමනය කරනු ලබන පණිවුඩ කාඩ්පත් හිමිකරු/හිමිකාරිය ලබා දී ඇති ජංගම දුරකථනයන්ට දැන්වීමට කටයුතු කරනු ඇත.

20.4. කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ මූල්‍ය තත්වයන් පිළිබඳ තොරතුරු බැංකුව ඉල්ලි සිටින ඕනෑම විටක ලබා දීමට ඔහු/ඇය බැඳී සිටී. කාඩ්පත හිමිකරු/හිමිකාරිය ඒ තොරතුරු තවදුරටත් තහවුරු කර ගැනීමේ අයිතිය බැංකුවට පවරයි. එලෙස අවශ්‍ය වන තොරතුරු ලබා නොදෙන විටක සිය අභිමතය පරිදි කාඩ්පත නැවත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ සහ අවලංගු කිරීමේ බලය බැංකුව සතුව පවතී.

20.5. තැපැල් මගින් යොමු කෙරෙන තොරතුරු ආපසු පැමිණි විටක සහ කාඩ්පත හිමිකරු/හිමිකාරිය සම්බන්ධ කරගත නොහැකි අවස්ථාවකදී අයදුම් පත්‍රයේ සඳහන් වෙනත් ලිපිනයකට යොමු කිරීමට පියවර ගනු ලැබේ.

20.6. කාඩ්පත හිමිකරුගේ/හිමිකාරියගේ ගිණුම් තොරතුරුවල අන්තර්ගත දත්ත, බැංකුවේ, නිලධාරීන්ට හෝ වෙනත් දත්ත සැකසුම් සේවා සපයන ආයතනයක හෝ කාඩ්පත් ගිණුම් ප්‍රකාශනයේ මුද්‍රණය කරනු ලබන හෝ තැපැල් කරනු ලබන ආයතනයකටලබා දීමේ අයිතිය බැංකුව සතු වේ.

20.7. සේවා ඉටු කිරීමේදී සිදුවන කවර හෝ අතපසුවීමක්, මග හැරීයාමක් හෝ ක්‍රමානුගත කාර්යයක යාන්ත්‍රික දෝෂයක් හෝ විදුලි, සන්නිවේදන වැනි තුන්වන පාර්ශවයක භාණ්ඩ හා සේවා ඉටු කිරීමේ දී හෝ සිදුවිය හැකි අලාභයක් හෝ විනාශවීමක් හෝ (ඇතුළත්ව නමුත් ප්‍රමාණාත්මක ලෙස දත්ත අස්ථානගත වීමකදී හැර) සඳහා බැංකුව වගකියනු නොලැබේ. හදිසි අනතුරු, කලබල, ආපදාවන්, අරගල, යුද්ධ, ස්වභාවික උපද්‍රව හෝ වර්ජන හෝ කාන්දු වීමක් වැනි බැංකුවේ පාලනයන් පරිබාහිරව කවර හෝ සිදුවීමක් නිසා වන පසු තත්වයන් සඳහා වගකීමකට බැංකුව බැඳී නොසිටී.